නාවික හමුදා පුරවැසි ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා නාවික හමුදා පුරවැසි ප්‍රඥප්තිය

ආයතනයේ දැක්ම	ශ්‍රී ලංකාවට අයත් සාගරික සම්පත් ආරක්ෂා කරමින් එහි ජාතික ආරක්ෂාව තහවුරු කරනු වස් නොගැඹුරු සහ ගැඹුරු දියඹෙහි අභියෝගවලට මුහුණ දිය හැකි ශක්තිමත් නාවික හමුදාවක් ලෙස වර්ධනය වීම.
ආයතනයේ මෙහෙවර	ශ්‍රී ලංකාවේ ජාතික ආරක්ෂාව තහවුරු කිරීම පිණිස අවශ්‍ය අවි උපකරණ සහිතව නිසි පුහුණුව ලබමින් සාගරික සම්පත් ආරක්ෂා කරමින් මහ මුහුදේ ආධිපත්‍යය රැක ගත හැකි නාවික හමුදාවක් බවට පත්වීම.
ආයතනයේ අගයන්	1. **ගෞරවය -** ගෞරවය යනු නාවික හමුදාවේ සහ නාවික පුද්ගලයන්ගේ කීර්ති නාමය රැකෙන පරිදි කටයුතු කිරීම රඳා පවතින මූලික වටිනාකමයි. ගෞරවය නාවික පුද්ගලයින්ගේ සදාචාරාත්මක ප්‍රමිතීන් පිළිබිඹු කරයි. එමෙන්ම ඒ තුළින් නාවික හමුදා පුද්ගලයින්ගේ ක්‍රියාවන්ට මඟ පෙන්වනු ලබන ඇතැම් නීතිරීති වලටද සිදු කළ නොහැකි සදාචාරාත්මක භාවය සහ ආත්ම ගෞරවය ආදීන් පිළිබිඹු වේ. 2. **අවංකභාවය -** සෑම නාවික පුද්ගලයෙකුම තමාට, නැව් මුළුවට සහ අනෙකුත් පුද්ගලයින්ට සත්‍යවාදී විය යුතුයි. සෑම නාවික පුද්ගලයෙකුම අනෙක් පුද්ගලයින් සමඟ විවෘතව සහ අවංකව කටයුතු කල යුතුයි. අවංකභාවය තුළින් පැහැදිලි හෘද සාක්ෂියකින් සහ පරාර්ථකාමීත්වයෙන් සේවය කිරීමට හැකියාව ලබාදෙයි. 3. **සුපිළිපන්නභාවය -** සුපිළිපන්නභාවය යනු කුමන ප්‍රතිඵලයක් ලැබුණත්, සෑමවිටම නිවැරදි දේ සිදු කිරීමට කැප වීමයි. සුපිළිපන්නභාවයෙන් යුත් නාවික පුද්ගලයින් ලෙස, තමාට ලැබෙන ප්‍රතිවිපාක කුමක් වුවත් වැරදි ක්‍රියාවන් නතර කිරීමට කටයුතු කළ යුතුය. 4. **විශ්වාසනීයභාවය -** විශ්වාසනීයභාවය යනු තම රාජ්‍යයටත්, එකිනෙකාටත් සේවය කිරීමේ වගකීමට කැපවීමයි. විශ්වාසනීයභාවය තුළින් ජාතියට සහ එකිනෙකාට ඇති අන්‍යෝන්‍ය බැඳීම පිළිබිඹු වේ. විශ්වාසනීයභාවය තුළින් තමා සමඟ රාජකාරි කරන පුද්ගලයින් අතර ඇති වගකීම සහ වගවීම වර්ධනය වේ. 5. **ධෛර්යය -** ධෛර්යය යනු අනතුරුදායක හෝ දුෂ්කර අවස්ථාවන්හිදී නිවැරදිව නොබියව මුහුණදීමයි. නාවික පුද්ගලයෙකුගේ ධෛර්යය ඔහු තුළ ඇති වගකීම, නිහතමානිකම සහ පෞද්ගලික ආදර්ශය මඟින් පිළිබිඹු වේ. නාවික පුද්ගලයෙකු තුළ කෙතරම් අධ්‍යාපනයක් හෝ පළපුරුද්දක් තිබුණද ධෛර්යය නොමැතිව අවස්ථාවන්

	ජයගත නොහැක. නාවික පුද්ගලයෙකුගේ භෞතික හා සදාචාරාත්මක නිර්භීතකම මත ධෛර්යය රඳා පවතී.
ආයතනයේ අරමුණු	ජාතියේ ස්වෛරීභාවයට සහ භෞමික අඛණ්ඩතාවයට එල්ල වන ඕනෑම තර්ජනයකින් ජාතිය ආරක්ෂා කිරීම සහ සමුද්‍රීය අවශ්‍යතා ආරක්ෂා කිරීම.
ආයතනයේ විධි නියමයන් (Mandate)	වෙරළබඩ ප්‍රදේශවල, ශ්‍රී ලංකාවේ සමුද්‍රීය කලාප වල සහ ගැඹුරු මුහුදේ ආරක්ෂාව සහතික කිරීමේ කාර්යය සඳහා බහුවිධ කාර්යය සේවාවන් පිහිටුවීමට 1950 අංක 34 දරන ශ්‍රී ලංකා නාවික හමුදා පනත මඟින් ශ්‍රී ලංකා නාවික හමුදාව ස්ථාපිත කර ඇත.
ආයතනය විසින් සැපයෙන සේවා	**<u>ශ්‍රී ලංකා නාවික හමුදාව මඟින් සැපයෙන සේවාමූලික මෙහෙයුම් කාර්යයන්</u>** 1. ශ්‍රී ලංකා මුහුදු කලාපයන්හි නීති විරෝධී මසුන් ඇල්ලීම වැළැක්වීම සහ මුහුදේදී අවශ්‍ය කරනු ලබන සහය ලබා දීමද ඇතුළුව ධීවරයින් ආරක්ෂා කිරීම. 2. නීති විරෝධී භාණ්ඩ ජාවාරම් සිදු කිරීමට එරෙහිව සහ ආගමනයට එරෙහිව කටයුතු කිරීම සඳහා ශ්‍රී ලංකා රේගුව සහ අදාළ අනෙකුත් ආයතනයන්ට අවශ්‍ය සහයෝගය ලබාදීම. 3. ජාතික ආරක්ෂාව, මහජන ආරක්ෂාව සහ සමුද්‍රීය ආරක්ෂාව තහවුරු කිරීම සඳහා ශ්‍රී ලංකා පොලිසිය, ශ්‍රී ලංකා වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුව, ආපදා කළමනාකරණ ආයතන සහ අනෙකුත් රාජ්‍ය හා ආරක්ෂක ආයතන සමඟ සමීප සම්බන්ධීකරණයෙන් හා ඒකාබද්ධව කටයුතු කිරීම. 4. මුහුදේදී සිදුවන මුහුදු මංකොල්ලකෑම් වැළැක්වීම හා කළමනාකරණය සඳහා අවශ්‍ය පියවර ගැනීම. 5. සමුද්‍රීය කලාපය තුළ සහ ශ්‍රී ලංකාවේ දේශීය ජල තීරයේ සිදුවන ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් මර්දනය කිරීමේ අරමුණින් නීතිය බලාත්මක කිරීමේ ආයතන සහ සන්නද්ධ හමුදාවන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම. 6. වරාය හා සමුද්‍රීය යටිතල පහසුකම් සඳහා ආරක්ෂාව සැලසීම. 7. මුහුදේදී ජීවිත හා දේපළ වල සුරක්ෂිතභාවය තහවුරු කිරීම. 8. වෙරළ තීරයේ සිදුකරනු ලබන නිරීක්ෂණ සහ ආවේක්ෂණ රාජකාරී කටයුතු මඟින් වෙරළ තීරයේ ආරක්ෂාව තහවුරු කිරීම සහ එමඟින් රටේ ජාතික ආරක්ෂාව තහවුරු කිරීම සඳහා කටයුතු කිරීම.

	9. සමුද්‍රීය දූෂණය ඇතුළු මුහුදේදී සිදුවන වෙනත් ව්‍යසන වැළැක්වීම, පාලනය කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම සහ නියාමනය කිරීමට අවශ්‍ය සහයෝගය ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව වෙත ලබාදීම. 10. ශ්‍රී ලංකාවට නීති විරෝධී සංක්‍රමණිකයන්, ආගමනිකයන් ඇතුළු වීම සහ විගමනයකින් පිටවීම වැළැක්වීම, මත් ද්‍රව්‍ය සහ මනෝවර්තක ද්‍රව්‍ය ජාවාරම් කිරීම හෝ ප්‍රවාහනය කිරීම වැළැක්වීම, තහනම් බඩු හා අවි ආයුධ සොයා ගැනීම හා අත්අඩංගුවට ගැනීම. 11. ශ්‍රී ලංකාවේ මුහුදු තීරයට විජාතික යාත්‍රා අනවසරයෙන් ඇතුළු වීම, නීති විරෝධී යාත්‍රා කටයුතු වල නිරත වීම වැළැක්වීමත් අත්අඩංගුවට ගැනීම සහ නීතිය ඉදිරියට පැමිණවීමටත් කටයුතු කිරීම. 12. මුහුදේදී ආපදාවට ලක් වන නෞකා/ යාත්‍රාවන්ට සහ එම නෞකා/ යාත්‍රාවන්හි සිට සොයාගනු ලබන තැනැත්තන් සඳහා අවශ්‍ය කරනු ලබන සහාය ලබාදීම. 13. මිත්‍ර රටවල් සමඟ සමුද්‍රීය ආරක්ෂක සහයෝගීතාවය, ඒකාබද්ධ අභ්‍යාස සහ අන්තර්ජාතික මෙහෙයුම් සඳහා දායකත්වය ලබාදීම. 14. කලාපීය හා ගෝලීය සමුද්‍රීය ආරක්ෂාව ශක්තිමත් කිරීම, අන්‍යෝන්‍ය විශ්වාසය හා සහයෝගීතාවය වර්ධනය කිරීම සඳහා මිත්‍ර රටවල නාවික හමුදා හා ආරක්ෂක ආයතන සමඟ සමුද්‍රීය සහයෝගීතා වැඩසටහන්, ඒකාබද්ධ පුහුණු අභ්‍යාස, තොරතුරු හුවමාරු වැඩසටහන් සහ අන්තර්ජාතික මානුෂීය හා ආරක්ෂක මෙහෙයුම් සඳහා ක්‍රියාකාරී දායකත්වය ලබාදීම. 15. රජය විසින් ශ්‍රී ලංකා නාවික හමුදාව වෙත කාලානුරූපව ලබා දෙනු ලබන හෝ පවරනු ලබන අනෙකුත් කාර්යය භාරයන් ඉටු කිරීම.

ශ්‍රී ලංකා නාවික හමුදාව මඟින් සැපයෙන වාණිජ, මහජන සේවාවන්

අ.අ	සපයනු ලබන සේවය	ඉදිරිපත් කළ යුතු තොරතුරු ලේඛන	සේවා ප්‍රමිතිය (පැය, දින, සති)	වගකිව යුතු ප්‍රධාන නිලධාරියා	සේවය පැහැර හැරීම සම්බන්ධ පැමිණිලි යාන්ත්‍රණය
1	ශ්‍රී ලංකා මුහුදු කලාපයන්හි නීති විරෝධී මසුන් ඇල්ලීම වැළැක්වීම සහ මුහුදේදී අවශ්‍ය කරනු ලබන සහය ලබාදීම සහ ධීවරයින් ආරක්ෂා කිරීම.	නීති විරෝධී මසුන් ඇල්ලීම සම්බන්ධ තොරතුරු	පැය 24	අධ්‍යක්ෂ ජෙනරාල් මෙහෙයුම්	නාවික හමුදා මූලස්ථානය/ අභ්‍යන්තර කටයුතු ඒකකය

2	ස්වභාවික ආපදා අවස්ථාවලදී සහන හා ගලවා ගැනීමේ මෙහෙයුම් සඳහා අවශ්‍ය සහයෝගය ලබාදීම.	ස්වභාවික ආපදාවන් සම්බන්ධ තොරතුරු	පැය 24	අධ්‍යක්ෂ ජෙනරාල් මෙහෙයුම්	නාවික හමුදා මූලස්ථානය/ අභ්‍යන්තර කටයුතු ඒකකය
3	ස්වභාවික හෝ වෙනත් හේතූන් මත ඇති වන ආපදා තත්ත්වයන්ගෙන් පසු නැවත ඉදිකිරීම් සහ ආරක්ෂක අමාත්‍යාංශයේ අනුමැතිය මත සිදු කරනු ලබන විවිධ ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය සහයෝගය ලබාදීම.	ආරක්ෂක අමාත්‍යාංශයේ අනුමැතිය	පැය 24	එකී සහයෝගය ලබාදීමේදී අදාළ අංශයන්ගේ ජ්‍යෙෂ්ඨතම නිලධාරියා	නාවික හමුදා මූලස්ථානය/ අභ්‍යන්තර කටයුතු ඒකකය
4	නාවික හමුදා යාත්‍රා මගින් මුහුදු සංචාර සහ තල්මසුන් නැරඹීමේ නෞකා චාරිකා ක්‍රියාත්මක කිරීම.	ලිඛිතව හෝ මාර්ගගතව සිදුකරන ඉල්ලීම (ලබාදී ඇති උපදෙස් පරිදි අවශ්‍ය තොරතුරු)	නිල වෙබ් අඩවියේ දැන්වීමේ සඳහන් පරිදි	අධ්‍යක්ෂ ජෙනරාල් සේවා / ප්‍රාදේශීය බලධාරීන්/ නෞකා අණහාර නිලධාරී	නාවික හමුදා මූලස්ථානය/ අභ්‍යන්තර කටයුතු ඒකකය
5	කිරින්ද කිමිදුම් මධ්‍යස්ථානය මගින් පරිසර හිතකාමී සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම හා සුවිශේෂී විනෝදාස්වාද අත්දැකීම් ලබාදීම.	ලිඛිතව හෝ මාර්ගගතව සිදුකරන ඉල්ලීම (ලබාදී ඇති උපදෙස් පරිදි අවශ්‍ය තොරතුරු)	නිල වෙබ් අඩවියේ දැන්වීමේ සඳහන් පරිදි	අධ්‍යක්ෂ ජෙනරාල් මෙහෙයුම්/ ආඥාපති දකුණු නාවික පෙදෙස	නාවික හමුදා මූලස්ථානය/ අභ්‍යන්තර කටයුතු ඒකකය
6	රාජ්‍ය හෝ රාජ්‍ය නොවන ආයතන මගින් සිදුකරනු ලබන ඉල්ලීම් පරිදි කිමිදුම් සේවාවන්හි සහාය ලබාදීම.	කිමිදුම් සේවාව ඉල්ලීමට අවශ්‍ය තොරතුරු	පැය 24	අධ්‍යක්ෂ ජෙනරාල් මෙහෙයුම්	නාවික හමුදා මූලස්ථානය/ අභ්‍යන්තර කටයුතු ඒකකය
7	මහජනතාවගේ පානීය ජල අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා හඳුනාගත් ප්‍රදේශ වල ජල පිරිපහදු මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම (RO Plant)	ජල අවශ්‍යතාවයන් පිළිබඳ තොරතුරු	පැය 24	අධ්‍යක්ෂ ජෙනරාල් ඉංජිනේරු	නාවික හමුදා මූලස්ථානය/ අභ්‍යන්තර කටයුතු ඒකකය
8	නාවික ඉන්ධන පිරවුම්හල මඟින් සිවිල් ප්‍රජාව වෙත අත්‍යවශ්‍ය යටිතල පහසුකම් සේවාවන් සැපයීම.	නොමැත	පැය 24	අධ්‍යක්ෂ ජෙනරාල් සැපයුම් හා සේවා	නාවික හමුදා මූලස්ථානය/ අභ්‍යන්තර කටයුතු ඒකකය
9	නාවික හමුදාවට අවශ්‍ය ආහාර ද්‍රව්‍ය හා	ප්‍රසම්පාදන	පැය 24	අධ්‍යක්ෂ	නාවික හමුදා

	භාණ්ඩ පිටත කොන්ත්‍රාත්කරුවන් මඟින් ප්‍රසම්පාදන ක්‍රියාවලිය යටතේ ලබාගැනීමේදී නාවික හමුදාව විසින් සිදුකරනු ලබන සේවාවන්.	ක්‍රියාවලියට අවශ්‍ය තොරතුරු හා ලිපි ලේඛන		ජෙනරාල් සැපයුම් හා සේවා	මූලස්ථානය/ අභ්‍යන්තර කටයුතු ඒකකය
10	**නාවික හමුදා සේවා වනිතා ඒකකය විසින් සිදුකරනු ලබන සුභසාධන සහ ප්‍රජා මූලික ව්‍යාපෘති.** අ. බේකරි සහ ආපනශාලා, යෝගට් ව්‍යාපෘති, ජූස් බාර් (Juice Bar) නිෂ්පාදන පාරිභෝගිකයින්ට සහන මිලට ලබාදීම. ආ. පවුල් සහ ප්‍රජා සහයෝගය, පෙර පාසල්, දිවා සුරැකුම් මධ්‍යස්ථාන පවත්වාගෙන යාම. ඇ. අබාන්ස් ප්‍රදර්ශනාගාර, සිංගර් ප්‍රදර්ශනාගාර මඟින් සහන මිල ගණන් යටතේ භාණ්ඩ පාරිභෝගිකයින් හට ලබාදීම. ඈ. තිරසාර ව්‍යාපෘති කෘෂි කාර්මික ව්‍යාපෘති, මල් තවාන් පවත්වාගෙන යාම. ඉ. වෙනත් සේවාවන් යටතේ තෑගි වෙළඳසැල්, පොත් සාප්පු, රූපලාවන්‍යාගාර පහසුකම් සැපයීම	නාවික හමුදා සේවා වනිතා ඒකකය මඟින් ලබාදී ඇති උපදෙස් අනුව ඉදිරිපත් කළ යුතු තොරතුරු	සේවා වනිතා ඒකකය විසින් ලබාදී ඇති කාලරාමුව පරිදි	සම්බන්ධීක රණ නිලධාරී, සේවා වනිතා ඒකකය	නාවික හමුදා මූලස්ථානය/ අභ්‍යන්තර කටයුතු ඒකකය
11	විශ්‍රාමික නාවික පුද්ගලයින් සඳහා වෛද්‍ය පහසුකම් ලබාදීම.	වෛද්‍ය පහසුකම් ලබාදීම වෙනුවෙන් අවශ්‍ය තොරතුරු	පැය 24	අධ්‍යක්ෂ ජෙනරාල් සෞඛ්‍ය සේවා	නාවික හමුදා මූලස්ථානය/ අභ්‍යන්තර කටයුතු ඒකකය
12	විශ්‍රාමික නාවික පුද්ගලයින් සඳහා විශ්‍රාම වැටුප් හා දීමනා සම්බන්ධ	වැටුප් හා දීමනා	පැය 24	අධ්‍යක්ෂ නාවික	නාවික හමුදා මූලස්ථානය/

	තොරතුරු හා සේවා ලබාදීම.	සම්බන්ධ තොරතුරු		(වැටුප් හා විශ්‍රාම වැටුප්)	අභ්‍යන්තර කටයුතු ඒකකය
13	විශ්‍රාමික නාවික පුද්ගලයින් සඳහා සුභසාධක සේවා ලබාදීම.	සුභසාධන සේවා ලබාදීම වෙනුවෙන් අවශ්‍ය තොරතුරු හා ලිපි ලේඛන	පැය 24	එකී සේවාව ලබාදීමේදී එම අංශයන්ගේ ජ්‍යෙෂ්ඨතම නිලධාරියා	නාවික හමුදා මූලස්ථානය/ අභ්‍යන්තර කටයුතු ඒකකය

<u>පැමිණිලි හා යෝජනා ඉදිරිපත් කිරීමේ ක්‍රමවේදය</u>

1. සියලුම පුරවැසියන්ගෙන් ඉදිරිපත් වන පැමිණිලි හා යෝජනා අපි භාර ගන්නෙමු.

2. ඔබ අප ආයතනය සමඟ සම්බන්ධවීමට අපේක්ෂා කරන්නේ නම් පහත පරිදි නාවික හමුදා මූලස්ථානය සම්බන්ධ කරගත හැක.

ලිපිනය - නාවික හමුදාධිපති
ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානය,
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය,
තැ.පෙ 593,
බත්තරමුල්ල.

දුරකථන අංක - 0117190000, 0117192001/2 (නාවික හමුදා මූලස්ථානය)
0117195674 (අභ්‍යන්තර කටයුතු ඒකකය)

විද්‍යුත් තැපෑල - nhqiau.sln@gmail.com (අභ්‍යන්තර කටයුතු ඒකකය)

WhatsApp අංකය - 074 3493659 **(**අභ්‍යන්තර කටයුතු ඒකකය)

QR කේතය - (අභ්‍යන්තර කටයුතු ඒකකය)

Internal Affairs Unit

3. අප ආයතනය පිළිබඳ වැඩිදුර තොරතුරු www.navy.lk වෙබ් අඩවිය මඟින්ද ලබාගත හැක.

පුරවැසි සේවාලාභී ප්‍රඥප්තිය අප විසින් සපයනු ලබන සේවාවන්ගේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා ඔබත් අපත් එක්ව දරන සාමූහික ප්‍රයත්නයකි.